Department of Education, Sabaragamuwa Province/ Weekly School



නිපුණතාව 16 - ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත සඵලදායකව සහ කාර්යක්ෂමව යොදා ගන්නා අයුරු විමසයි.

නිපුණතා මට්ටම 16.10 - කාර්මික සම්බන්ධතා විමර්ෂණය කරයි.

**සේව්‍ය - සේවක සම්බන්ධතා**

සේව්‍ය - සේවක දෙපාර්ශ්වය අතර පවත්නා කවර හෝ ආකාරයක වෘත්තීය සම්බන්ධතා සේව්‍ය - සේවක සම්බන්ධතා ලෙස හැඳින්වේ.

මානව සම්පත් කළමනාකරණයේ සාර්ථකත්වය සඳහා ආයතනය තුළ සේවකයන් හා සේව්‍යයන් අතර මනා සම්බන්ධතාවක් තිබිය යුතු ය. එය සේවකයන් උනන්දුවෙන් හා තෘප්තිමත් ව රැකියාව කරගෙන යාමට ඉවහල් වේ. ඒ අනුව යහපත් ශ්‍රමික සම්බන්ධතා මඟින් විවිධ ප්‍රයෝජන මෙන් ම අයහපත් ශ්‍රමික සම්බන්ධතා මඟින් විවිධ ගැටලු ද ඇති වේ.

- **සේවාදායකයා** (Employee)

සේව්‍යයා යටතේ කුමන හෝ තරාතිරමක පදනමක් හෝ ගිවිසුමක් මත යම් පරිශ්‍රමයක් ලබමින් වැඩ කරන හෝ වැඩ කිරීමට ගිවිසුම් ඇති කර ගත් ඕනෑම පුද්ගලයෙකු සේවාදායකයෙකු ලෙස හැඳින්වේ.

- **සේව්‍යයා** (Employer)

කිසියම් පරිශ්‍රමිකයක් මත යම් පුද්ගලයෙකු පුද්ගල කණ්ඩායක් යම් සේවයක නිරත කරවන්නන් සේව්‍යයා ලෙස හැඳින්වේ.

<u>**අභ්‍යාස**</u>

1.යහපත් සේව්‍ය - සේවක සම්බන්ධතාවලින් ආයතනයට අත්වන වාසි 5ක් ලියන්න.

2. අයහපත් සේව්‍ය - සේවක සම්බන්ධතාවලින් ආයතනයට අත්වන අවාසි 5ක් ලියන්න.

3.සේවක අයිතිවාසිකම් යනු මොනවාද?නිදසුන් 3ක් දෙන්න.

4.සේව්‍ය - සේවක වගකීම් 3 බැගින් හා යුතුකම්3 බැගින් ලියන්න.